# සාම්ප්‍රදායික ගොවිතැන හා බැඳුණු අතීත උරුමය (කළුන්දෑව ගම්මානය ඇසුරින්)

**එම්.ජී. අකිලා මල්කි නිසංසලා කරුණාරත්න**

පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය

**ප්‍රමුඛ පදඃ** ගොඩ ගොවිතැන, මඩ ගොවිතැන, අතීත උරුමය, සාම්ප්‍රදායික, කළුන්දෑව ගම්මානය

## හැඳින්වීම

පුරාණ ලෝකයේ ගම සංවිධානය වීම ක්‍රි. පූ. 6000 පමණ පැරණි කාලයක දී සිදුවූ බව මානවවංශ පුරාවිද්‍යාඥයින්ගේ පිළිගැනීමයි. ප්‍රාග් ඓතිහාසික යුගයෙන් පසුව මිනිසා ශාක හා සත්ව ගෘහාශ්‍රිතකරණයට යොමුවීමත් සමඟ ප්‍රාථමික මට්ටමින් නිර්මාණය වූ ගම පසුකාලීනව ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වෙමින් පැමිණ වර්තමානය වන විට ගෝලීය වානිජකරණයේ බලපෑම හමුවේ මානව ජීවන රටාව අතිශය සංකීර්ණ තත්වයකට අවතීර්ණ වී ඇත. දේශීය වශයෙන් ගත් කල කෘෂිකර්මාන්තය පදනම් කරගත් පුරාණ ගමක් සතුව පැවති අතීත ස්පර්ෂිත හා අස්පර්ෂිත උරුමයන් බොහෝමයක් මේ වන විට අභාවයට ගොස් ඇති අතර විශේෂයෙන් අතීත ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය තුළදී අනුගමනය කරන ලද සාම්ප්‍රදායික ක්‍රමවේද රාශියක් පවතී. එහෙත් මේ වන විට එම අතීත දැනුම වියැකී ගොස් ඇති අතර ඒවා භාවිතය ද ප්‍රායෝගික මට්ටමින් සිදු නොවේ. කළුන්දෑව ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල මැතිවරණ කොට්ඨාශයට අයත් පුරාණ සාම්ප්‍රදායික ගම්මානයකි. තුන් පැත්තකින් කඳු හා මහා මූකලානින් වට වූ කළුන්දෑව ගම්මානය අනුරාධපුර යුගයේ සිටම ජනාවාස වී පැවතී ඇත. අතීතයේ පටන් ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තය විය. වර්තමානය වනවිට සාම්ප්‍රදායික ගොවිතැන ආශ්‍රිත උක්ත දක්වන ලද අගයන් ශේෂ වී ඇති ද යන්න මෙම ගම්මානය ආශ්‍රයෙන් හඳුනා ගැනීමට දරන ලද උත්සාහයක් වශයෙන් මෙම පර්යේෂණය හඳුන්වා දිය හැකිය. මෙම පර්යේෂණයේ අරමුණු ලෙස සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තය හා බැඳුණු ස්පර්ෂිත උරුමය හඳුනා ගැනීම, සාම්ප්‍රදායික ගොවිතැන හා බැඳුණු අස්පර්ෂිත උරුමය හඳුනා ගැනීම, සාම්ප්‍රදායික ගොවිතැන, ජීවන රටාව හැඩ ගැස්වීමෙහිලා බලපා ඇති ආකාරය හඳුනා ගැනීම හා නූතන වානිජකරණය, සාම්ප්‍රදායික ජන ජීවිතයට කෙතරම් දුරට බලපා ඇත් ද යන්න හඳුනා ගැනීම ආදිය පෙන්වා දිය හැකි ය.

## ක්‍රමවේදය

ප්‍රධාන වශයෙන් ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍ර භාවිතය ඇසුරින් සිදුකරන ලද අතර ක්ෂේත්‍ර ගවේෂණය, අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා, ලිපි ලේඛන හා ග්‍රන්ථ පරිශීලනය මගින් දත්ත එක්රැස් කිරීම සිදුකරන ලදී. උක්ත ක්‍රමවේද මගින් එක්රැස් කරගත් දත්ත PEST විශ්ලේෂණ ක්‍රමවේදය මගින් විශ්ලේෂණය කර සිතියම්, වගු සහ ප්‍රස්තාර, ඡායාරූප හා ඉදිරිපත් කිරීම (presentation) මගින් ඉදිරිපත් කරනු ලබයි.

### ප්‍රතිඵල හා සාකච්ඡා

අතීත ශ්‍රී ලංකාව තුළ මඩ ගොවිතැනට සාපේක්ෂව ගොඩ ගොවිතැන බහුලව සිදුකර ඇත. ගොඩ ගොවිතැනේ දී සැතපුම් 10-12 පමණ ඔබ්බෙන් වනය තුළට වැදී කැළෑ ගිනි තබා බිම් සකස් කොට තල, කුරහන්, වැනි බෝග වගා කිරීම කළ අතර ඊට අමතර ව වට්ටක්කා, කැකිරි, මෑ, ලබු, දුහුල් ආදිය වගා කර ඇත. වගාව ආරම්භයට පූර්වයෙන් දෙවියන් වැදීම (කළුදැකඩ දෙවියන්) වැනි ඇදහිලි විශ්වාස මුල් කරගත් කටයුතු මෙන් ම වගාව අතර තුර පැල් රැකීම, උගුල් ඇටවීම, ස්වාභාවික පොහොර යෙදීම වැනි කටයුතු සිදු වී ඇත.

අතීත ගොඩ ගොවිතැන වෙනම විශේෂ වූ සංස්කෘතියක් ලෙස සැළකීම ද විටක නිවැරදි විය හැක. ගොඩ ගොවිතැනට ආවේනික වූ අංග කිහිපයකින් පෝෂණය වීම එයට හේතුවයි. හෙනේ තිබෙන වැදගත් ම අංග ලෙස දඬු වැට (කැලෑව පිළිස්සීමෙන් පසු ඉතිරි වන කුඩා ලී දඬු යොදා ගනිමින් සතුන්ට ඇතුල් විය නොහැකි ලෙස ඇහිරීම) හා හේනේ පැල ආදිය දැක්විය හැක. මෙහිදී දඬු වැට ආශ්‍රිත ව පැරණි ගොවියා තම වගාව වන සතුන්ගෙන් ආරක්ෂා කර ගැනීමට විවිධ උගුල් ඇටවීමේ ක්‍රම භාවිත කරන ලදි. එහිදී සතුන්ගේ විවිධත්වය අනුව විවිධ උගුල් වර්ග භාවිතා කර ඇත. (හබක, කරක). ගොඩ ගොවිතැනේ දී ඉදි කරන පැල ද වර්ග දෙකකි. එනම්, ගහ උඩ පැල හා කටුමැටි පැල යනුවෙනි. කටුමැටි පැල සකස් කරන්නේ ශක්තිමත් ලී දඬු හතරක් යොදා ගනිමින් ඒවා හතර කොනේ සිටුවා වරිච්චි ගසා ගැනීමෙනි. පැලේ දී භාවිත කරන ලද උපකරණ ලෙස අඩි වළඳ (ආහාර අනුභවය සඳහා), ලබු කැටය (ජලය ලබා ගැනීමට), පොල් කට්ට, ආදිය පෙන්වාදිය හැකිය. සෑම නිවසක ම අම්බරුවන් සිටි අතර ඔවුන් සශ්‍රීකත්වයේ සංකේතය විය. ගොවිතැනේ දී, අම්බරුවන් යොදා ගනිමින් බිම් සැකසීම, සාම්ප්‍රදායික කෙම් ක්‍රම භාවිතය, අත්තම් ක්‍රමය (මැඩවීම, වල් නෙලීම, පැල සිටුවීම, අස්වැන්න නෙලීම, වැනි අවස්ථාවල දී ශ්‍රමය සැපයීම) ආදිය පැවතී ඇත. සෑම නිවසකම වී බිස්ස, අටුව, යන කෘෂිකාර්මික ග්‍රාමීය අංගයන් ගෙන් සමන්විත විය. හේන් ගොවිතැන ප්‍රධාන වශයෙන් සිදු වූ අතර මඩ ගොවිතැනට යොමු වූ ප්‍රමාණය අතීතයේ දී අඩු විය. මුළු ගම්මානයේ ම කුඹුරු ඉඩම් ඉතා සුළු ප්‍රමාණයක් විය. ප්‍රධාන ආහාරය ලෙස කුරහන් ලබාගෙන ඇත. කෘෂිකර්මාන්තයට අවශ්‍ය ජලය ගම වටා පිහිටි ඇල හා ගම කෙළවරේ ඇති වැව ආශ්‍රයෙන් ලබා ගෙන ඇත. මෙහි දී වසරකට කන්න හතරක් වගා කරමින් වසර පුරා අස්වැන්න ලබා ගනී. ඒ ගොඩ භෝග සඳහා කන්න දෙකක් ද මඩ ගොවිතැනින් කන්න දෙකක් ද වශයෙනි.

කළුන්දැව ගම්මානයේ ගොවිතැන් කටයුතුවල වර්තමාන තත්ත්වය පිළිබඳ සැලකීමේ දී හේන් වගාව වර්තමානය වන විට දක්නට නොලැබේ. වර්තමානයේ දී මඩ ගොවිතැන සිදු කරන අතර වසරකට කන්න තුනක් වී හා අනිකුත් බෝග වගා කෙරේ. මාස් කන්නයට අක්කර එකසිය පනස් හයක් වී වගා කරන අතර ඉතිරි කන්න දෙක බහුල වශයෙන් එළවළු වගා කරයි. මෙලෙස කන්න කිහිපයක් වගා කටයුතු කරමින් දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය නිසා මොවුන් ඉක්මනින් අස්වැන්න අළෙවි කර ඉතා ඉහළ ආදායමක් ලබා ගනී. වර්තමානයේ දී නවීන යන්ත්‍රෝපකරණ යොදා ගනිමින් වගා කටයුතු සිදු කරන අතර ඊට අවශ්‍ය ජලය හුරුළු ඇල, බෝවතැන්න ජලාශය ආදියෙන් සපයා ගනී.

වර්තමානය වන විට සාම්ප්‍රදායික කෘෂිකාර්මික රටාව දක්නට නොලැබේ. මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන්

ඉඩම් අහිමි වීම, හේන් වගාවට අවැසි ඉඩකඩ නොමැති වීම, කැළෑ එළිපෙහෙළි කිරීම හා ගිනි තැබීම තහනම් කිරීම, වනරක්ෂිත නියම කිරීම, ජනගහන වර්ධනය, දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය බිහිවීම, ආර්ථික තරඟකාරීත්වය, ආදී කාරණා ඊට හේතු වී ඇත. ගොවිතැන පදනම් වූ ආර්ථිකයක් පැවතිය ද ශීඝ්‍ර වානිජකරණය හමුවේ කළුන්දැව ගම්මානය ආශ්‍රයෙන් සාම්ප්‍රදායික ගොවිතැන හා බැඳුණු අතීත උරුමය, ජීවන රටාව තුරන් වී ඇති බවට නිගමනය කළ හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


**මහාවංසය**, 1996, ශ්‍රී සුමංගල සහ බටුවන්තුඩාවේ දේවරක්ෂිත, සංස්:2. කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

විජේසිංහ, පී.ආර්.එච්. (1894) ***ජන ව්‍යප්තිය හා සමාජ තතු.*** " ඓතිහාසික මාතලේ." මාතලේ දිසා සංස්කෘතික මණ්ඩලය. රජයේ මුද්‍රණ දෙපාර්තුමේන්තුව.

ගුණවර්ධන. ප්‍රිශාන්ත (2004) ***පුරාණ ගම.*** කොළඹ. සමන්ති ප්‍රකාශකයෝ.